**ශීර්ෂය 283 - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව**
**-----------------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**
**--------------**

**1.1 තත්වාගණනය කල මතය**
**-------------------------**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්වාගණනය කල මතය සඳහා පදනම**
**--------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**
**------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ප්‍රකාශ කල නොහැකි විය.

(ආ) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම**

---

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නියමිත දිනයට පහත සඳහන් සැසඳුම් ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව වූ සැසඳුම් ප්‍රකාශය**<br>2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව විෂය අංක 283011 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව 2019 පෙබරවාරි 28 දිනට හෝ ඊට පෙර විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, එය මාස 01 දින 24 ක ප්‍රමාදයකින් පසුව 2019 අප්‍රේල් 24 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව සැසඳුම් ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. | 2018 වසරට අදාල ගිණුම සැකසීමේදී යම් ප්‍රමාදයක් සිදු වූ බවත් ඉදිරියේදී එය නිවැරදි දිනට පෙර ලබා දීමට කටයුතු කරන බව. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

---

**(අ) ආදායම් ලැබීම්**

---

දෙපාර්තමේන්තුවට අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වාර්ෂික සංශෝධිත අයවැය ඇස්තමේන්තුව අනුව පුද්ගලික දැව ප්‍රවාහන ආදායම් සංකේතයට අදාළව රු. මිලියන 110 ක බලපත්‍ර ගාස්තු ආදායමක් රැස්කිරිමට ඇස්තමේන්තු කර තිබුණද රු. මිලියන 104.79 ක ශුද්ධ ආදායමක් රැස් කර තිබුණි. | මුදල් රෙගුලාසි 128(2) ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් නිවැරදි ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරිම හා අදාල වන පරිදි සංශෝධනයන් කළ යුතු අතර, 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන | සියයට සියයක්ම නිවැරදිව පුරෝකථනය කිරීම අපහසු බවත් වර්ෂය තුල ඉල්ලුම් කරන අයදුම්පත්‍ර ඊට පෙර වර්ෂයේදී දැන ගැනීමට නොහැකි බව. |

| | | | |
|---|---|---|---|
| | එබැවින් ආදායම් සීමාවට ලගා නොවීම රු. මිලියන 5.21 ක් වු අතර එය සියයට 4.73 කින් පහළ යාමක් ලෙස නිරීක්ෂණය විය. | රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුගමනය කර ආදායම් පරිපාලනය වඩාත් කාර්යක්ෂමව ඉටු කළ යුතු වීම. | |
| **(ii)** | රජයේ කැළෑ වලින් ලැබෙන ආදායම් සංකේතයට අදාළව රු. මිලියන 1,800 ක වාර්ෂික ආදායමක් රැස්කිරිමට ඇස්තමේන්තු කර තිබුණද රු. මිලියන 1,906.61 ක ශුද්ධ ආදායමක් රැස් කර තිබුණි. එබැවින් ආදායම් සීමාව ඉක්ම වීම රු. මිලියන 106.61 ක් වු අතර එය සියයට 5.92 කින් ඉහළ යාමක් ලෙස නිරීක්ෂණය විය. | - එම - | වනජ ද්‍රව්‍ය ඉවත් කිරීමේ ගාස්තු, රජයේ කැළෑවලට ඇතුළත් වීමේ ගාස්තු, ප්‍රකාශන අලෙවිය, පැළ විකිණීම, ෆයිනස් දැව අපහරණය හා වෙනත් ආදායම් එකතු කරනු ලබන බවත් එම ආදායම් අදාල වර්ෂයට පෙර පුරෝකථනය කිරීමට අපහසු බව. |
| **(iii)** | පසුගිය වර්ෂ 03 තුල ඉහත ආදායම් සංකේත 02 කට අදාල මුළු හිඟ ආදායම පිළිවෙලින් රු. මිලියන 2.32 ක් හා රු. මිලියන 410.20 ක් වු අතර වර්ෂය අවසානයේ තවදුරටත් හිඟ මුදල පිළිවෙලින් රු. මිලියන 0.55 ක් හා රු. මිලියන 125.44 ක් විය. | මුදල් රෙගුලාසි 175(2) ප්‍රකාරව ආදායම් එකතු කරන නිලධාරියා කටයුතුකළ යුතු අතර කටයුතු කිරිම පැහැර හැර ඇති නිලධාරින් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව විනය පියවර ගත යුතු වීම. | පුද්ගලික දැව ප්‍රවාහනය ආදායම් සංකේතයට අදාල රු. මිලියන 0.55 ක හිඟ මුදල බලපත්‍ර දීර්ඝ නොකිරීම නිසා උද්ගත වී ඇති බවත් රජයේ කැළෑ වලින් ලැබෙන ආදායම් සංකේතයට අදාල හිඟ මුදල තුල රු. මිලියන 125.15 ක් රාජ්‍ය දැව සංස්ථාවෙන් ලැබිය යුතු හිඟ ස්කන්ධභාග මුදල බවත් ඉතිරිය බලපත්‍රහිමි ආයතන අදාල බලපත්‍ර අළුත් කර නොගැනීම නිසා හිඟ වී ඇති බව. |

**(ආ)** **ආදායම් නොවන ලැබීම්**

**-------------------------**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ආදායම් නොවන ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය<br>--------------------- | නිර්දේශය<br>------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>---------------------- |
|---|---|---|---|
| **(i)** | සමාලෝචිත වර්ෂය අවසානයේදී නොපිය වු අග්‍රිම ශේෂය රු. මිලියන 20.48 ක් විය. | මු.රෙ. 373(1) ප්‍රකාරව දෙසැම්බර් 31 දිනට ඇති ශේෂය එදිනම භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කල යුතු වීම. | 2019 ජනවාරි 02 දින අග්‍රිම ශේෂය මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කල බව. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | තෙවන පාර්ශවයක් වෙත නැවත ගෙවීම සඳහා තාවකාලිකව රඳවා ගන්නා තැන්පතු ලැබීම් රු. මිලියන 477.37 ක් වූ අතර එය මුළු තැන්පතු වලින් සියයට 53.38 ක් විය. | තෙවන පාර්ශවය දැනුවත් කර අදාළ කාර්යයන් අවසන් වී ඇත්නම් තැන්පතු ආපසු ගෙවීමට කටයුතු වීම. | වැඩ අවසන් නොමැති ව්‍යාපෘති වල මුදල් තැන්පතු ගිණුමේ පවත්වා ගෙන යා යුතු බව. |

**(ඇ)** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

-----------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය**<br>--------------------- | **නිර්දේශය**<br>----------- | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>---------------------- |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයෙහි ආරම්භක ශේෂය රු. මිලියන 215.56 ක් ලෙස සඳහන් කර තිබුණු අතර ඉකුත් වර්ෂයෙහි එම ශේෂය රු. මිලියන 215.70 ක් විය. ඒ අනුව ආරම්භක ශේෂ අතර රු. මිලියන 0.14 ක වෙනසක් විය. | වෙනස පරීක්ෂා කර බලා නිවැරදි කල යුතුය. | දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ස්ථාන මාරු වී ගිය නිලධාරියකුගේ ණය ශේෂය මෙයට බලපා ඇති බව. |
| (ii) | සැසඳුම් ප්‍රකාශයට අනුව දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අවසාන ශේෂයන් පිළිවෙලින් රු.මිලියන 211.79 ක් හා රු. මිලියන 211.58 ක් විය. ඒ අනුව රු. මිලියන 0.21 ක වෙනසක් විය. | - එම - | විභාග දෙපාර්තමේන්තුව (ශීර්ෂය 212) විසින් වැරදීමකින් රු. මිලියන 0.21 ක් බැර කර ඇති බව. |

**(ඈ)** තැන්පතු

----------

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ තැන්පත් ගෙවීම් හා ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | **විගණන නිරීක්ෂණය**<br>--------------------- | **නිර්දේශය**<br>----------- | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>---------------------- |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ඇප තැන්පතු ශේෂය රු. මිලියන 377.83 ක් විය. ඉන් රු. මිලියන 74.39 ක් වූ තැන්පතු වසර 05 ක් ද, රු. මිලියන 183.56 ක් තැන්පතු වසර 02 ක් ඉක්මවූ තැන්පතු බව නිරීක්ෂණය විය. | මු.රෙ. 571(2) ප්‍රකාරව කල් ඉකුත් වූ තැන්පතු අදාල තැන්පතු කරුවන්ගෙන් විමසීමක් කර රාජ්‍ය ආදායමට බැර කල යුතු වීම. | පුද්ගලික වන වගා යටතේ ඇප තැන්පතු වසර 30 ක ව්‍යාපෘති කාලය අවසන් වන තුරු රඳවා ගත යුතු බවද අනෙකුත් ඇප තැන්පතු වලින් රු. මිලියන 0.47 ක් 2019/05/10 දින රාජ්‍ය ආදායමට බැර කර ඇති බව. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | තෙවන පාර්ශවයක් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවා ගන්නා තැන්පතු ශේෂය රු. මිලියන 38.19 ක් වූ අතර ඉන් රු. මිලියන 7.31 ක් වූ තැන්පතු වසර 05 ක් හා රු. මිලියන 4.59 ක් වූ තැන්පතු වසර 02 ක් ඉක්මවා තිබුණි. | - එම - | වසර දෙකකට හා වසර පහකට වැඩි වුවද වැඩ සම්පූර්ණ නොකල ව්‍යාපෘති සම්බන්ධයෙන් මුදල්, තැන්පතු ගිණුමේ පවත්වා ගෙන යා යුතු බව. |

**(ඉ)** **දේපල පිරියත හා උපකරණ**

------------------------------

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය .

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------- | ----------- | ---------------------- |
| **(i)** | ඉකුත් වර්ෂයේ ජංගම නොවන වත්කම් හි අවසාන ශේෂය රු. මිලියන 926.18 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ එහි ආරම්භක ශේෂය රු. මිලියන 798.25 ක් වුයෙන් රු. මිලියන 127.93 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉකුත් වර්ෂයේ අවසාන ශේෂය හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය අතර වෙනස නිරවුල් කල යුතු වීම. | ආරම්භක ශේෂයේ වැරදීමකින් සිදු වී ඇති බවත් රු. මිලියන 926.18 ක් ලෙස ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. |
| **(ii)** | 2018 ජනවාරි 01 දිනට හදුනා ගෙන ඇති වත්කම් සිගාස් වැඩසටහනට ඇතුලත් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුලදී අත්පත් කර ගැනීම් හා අපහරණයන් ද මුල්‍ය ප්‍රකාශනයෙහි ඇතුලත් කර නොතිබුණි. | සියලූම ජංගම නොවන වත්කම් සිගාස් වැඩසටහනට ඇතුලත් කල යුතු අතර එම වැඩසටහන යාවත්කාලීන කල යුතු වීම. | වත්කම් සිගාස් වැඩසටහනට ඇතුලත් කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව. |

**(ඊ)** **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

----------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------------- | ------------ | ------------------------- |
| **(i)** | **ස්ථාවර වත්කම් ලේඛනය**<br>----------------------------<br>1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 මඟින් ලබා දී ඇති පොදු උපදෙස් අනුව ස්ථාවර වත්කම් ලේඛනයක් |

| | | |
|---|---|---|
| පරිශිෂ්ටයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනය විගණකාධිපතිගේ එකඟත්වය ඇතිව පවත්වා ගත යුතුය. | පවත්වා ගෙන යාම අනිවාර්ය නොවන බව දන්වා ඇති බව. |

(ii) **බැරකම් පිළිබඳ ලේඛනය**

---------------------------

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරික්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය. | දෙපාර්තමේන්තුවට ප්‍රමාණවත් තරම් අක්මුදල් තිබෙන නිසා බැරකම් ලේඛනයක් පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවයක් නොමැති බව. |

(උ) **ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

-------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| **නිරීක්ෂණය** | **නිර්දේශය** | **දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම** |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පනත ප්‍රකාරව විගණකාධිපති වෙත පිටපතක් ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. |

**(ඍ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| (i) | මුදල් රෙගුලාසි 104(3) හා 104(4) | ගණනය කල නොහැක. | ප්‍රාරම්භක වාර්තා හා පරිපූර්ණ වාර්තා ඉදිරිපත් නොකරන ලද හානිවීම් 10 ක් සමාලෝචිත වර්ෂයේදී වාර්තා කර නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව පරිපූර්ණ වාර්තාවක් හා අවසාන වාර්තාවක් ඉදිරිපත් කල යුතු වීම. | අවශ්‍ය උපදෙස් ලබා දෙමින් මෙම තත්ත්වය මග හරවා ගැනීමට කටයුතු කරන බව. |
| (ii) | මුදල් රෙගුලාසි 570 හා 571(2) | ගණනය කල නොහැක. | ඇප තැන්පතු හා තෙවන පාර්ශවයක් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රදවා ගන්නා තැන්පතු සම්බන්ධයෙන් කටයුතු සිදු කර නොතිබුණි. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කල යුතු වීම. | ව්‍යාපෘතියෙහි වැඩ අවසන් වනතුරු තැන්පතු මුදල් රදවා ගත යුතු බව. |
| (iii) | මු.රෙ. 396 (ඇ) | 1,771,496 | නිකුත් කරන ලද නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ මාස 06 ඉක්මවන ලද චෙක්පත් 177 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | බැංකු සැසඳුම සකස් කරන ලද නිලධාරියා ස්ථාන මාරු වී ගිය බැවින් ගැලපීම් කිරීමට පමා වූ බවත් ඉදිරියේදී මෙම තත්ත්වය මග හරවා ගැනීමට කටයුතු කරන බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම, ප්‍රතිපාදන මාරු කිරීම, පරිපූරක අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන ලබා ගැනීම හා උපයෝජනය, ප්‍රතිපාදන උපයෝජනය කිරීම, ඉතිරිවීම් සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අවශ්‍යතා හඳුනාගැනීමකින් තොරව ප්‍රතිපාදන සලසා ගැනීම හා සැලසුම් කල පරිදි කටයුතු නොවීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයන් 04 ක් සඳහා වෙන් කර තිබූ රු. මිලියන 496.33 කින් රු. මිලියන 68.39 ක් හෙවත් සියයට 7.5 සිට 20.64 අතර පරාසයක ඉතිරිවීම් පැවතුනි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | සමස්ථ වියදම් ප්‍රතිශතය සියයට 95 ක් බවත් පුනාරවර්තන වැය විෂයන් 20 න් 16 කම ඉතිරිවීම් සියයම 5 කට වඩා අඩු බව. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයයන් 02 ක් සඳහා මු.රෙ. 66 යටතේ මාරු කර තිබූ රු. මිලියන 135.70 ක ප්‍රතිපාදනවලින් රු. මිලියන 67.35 ක් හෙවත් සියයට 18.29 සිට 51.33 ක් දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුනි. | ප්‍රතිපාදන අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන ප්‍රමාණවත් ප්‍රතිපාදන පමණක් මාරු කල යුතු වීම. | අවශ්‍යතාවයට පමණක් ප්‍රතිපාදන මු.රෙ. 66 යටතේ මාරු කරනු ලැබුවද ඉහත වැය විෂයන් 02 හි ප්‍රතිපාදන ඉතිරි වූ බව. |

### 2.2 බැංකු ගිණුම් මෙහෙයවීම

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | බැංකු ගිණුම් 03 ක එකතුව රු. 70,651 ක ශේෂයක් මූල්‍ය ප්‍රකාශන වල වැඩිපුර සටහන් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල වැඩිපුර සටහන් වූ ශේෂයන් නිවැරදි කල යුතු වීම. | මාස 06 කට වැඩි කාලයක් ගතවූ චෙක්පත් වෙනුවට මාස 05 කට වඩා වැඩි කාලයක් ගත වූ චෙක්පත් වල වටිනාකම බැංකු ගිණුම් 03 ක සටහන් වීම. |
| (ආ) | බැංකු සැසඳුම් අනුව හඳුනා නොගත් ලැබීම් හා ගෙවීම් ශේෂය පිළිවෙලින් රු. මිලියන 24.57 ක් හා රු. මිලියන 1.13 ක් ලෙස දක්වා තිබුණු අතර මෙම ශේෂ මාස 06 සිට වර්ෂ 02 ක දක්වා කාල | අදාල ශේෂ හඳුනාගෙන ගැලපීම් කල යුතු වීම. | 2018.12.31 දිනට හඳුනා නොගත් ලැබීම් කොටසක් හඳුනා ගැනීමට කටයුතු කර ඇති බවත් ඉතිරි හඳුනා නොගත් ලැබීම් රාජ්‍ය |

| | | |
|---|---|---|
| පරාසයක විය. | | ආදායමට බැර කිරීමට කටයුතු කර ඇති බව. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කාර්මික වනවගා ස්ථාපනය සහ කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා ප්‍රතිපාදනය රු. මිලියන 325 ක් වූ අතර ක්‍රියාකාරී සැලැස්මට අනුව එම කාර්යය යටතේ නැවත වනවගා කිරීම, වානිජමය තුනී කිරීම් හා පශ්චාත් හෙලීම් සංගහනය හි ඉලක්කයන් පිලිවෙලින් හෙක්ටයාර් 956.2, හෙක්ටයාර් 701.49 ක් හා හෙක්ටයාර් 1,385.21 ක් ඉටු කල යුතු විය. කාර්ය සාධන වාර්තාවට අනුව එම කාර්යයන් ඉටු කර ඇති ප්‍රමාණය වුයේ හෙක්ටයාර් 951.70, හෙක්ටයාර් 695.78 ක් හා හෙක්ටයාර් 926.52 කි. | ඉලක්කයන් ලගා කර ගැනීමට සැලසුම් සකස් කල යුතු වීම. | අදහස් දක්වා නැත. |

**3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

පහත සඳහන් නිරීක්ෂණන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2019 මැයි 31 දින වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | අදහස් දක්වා නොමැත. |

**3.3 ප්‍රසම්පාදනයන්**

**----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය**<br>**---------------------** | **නිර්දේශය**<br>**----------** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>**-----------------------** |
|---|---|---|---|
| (අ) | විශේෂිත වර්ගයේ මායිම් කණු නිපදවීම සඳහා ෆයිබර් අච්චු අකුරැස්ස සිට ත්‍රිකුණාමලය දිසා වන කාර්යාලය වෙත නිෂ්පාදනය කර ප්‍රවාහනය කර දීමට එකක් රු. 14,000 බැගින් අච්චු 70 ක් සඳහා රු. 980,000 ක් ප්‍රසම්පාදනයට අනුමැතිය ලබා දී තිබුණද එම අනුමැතියට පරිබාහිරව තවත් ෆයිබර් අච්චු 140 ක් සඳහා රු. 1,960,000 ක් වැය කර තිබුණි. | දිසා වන කාර්යාලයේ ප්‍රසම්පාදන අනුමැති සීමාව වූ රු. 1,000,000 ක් වන අතර එම සීමාව තුල ප්‍රසම්පාදන කටයුතු කල යුතු වීම. | ප්‍රසම්පාදන ක්‍රමවේදය උල්ලංඝනය වීමක් සිදු වී ඇති බවද මෙම තත්ත්වය ඉදිරියේදී වලක්වා ගැනීමට කටයුතු කරන බව. |
| (ආ) | අනුරාධපුර දිසා වන කාර්යාලය විසින් විශේෂිත මායිම් කණුවක් රු. 1,100 බැගින් පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබුණු අතර එම මිලටම ත්‍රිකුණාමලය දිසා වන කාර්යාලයට අවශ්‍ය මායිම් කණු 23,000 ක් රු. 25,300,000 කට මිලදී ගත හැකිව තිබුණි. නමුත් රු. 27,465,050 ක් වැය කර මායිම් කණු නිපදවා තිබීම හේතුවෙන් රු. 2,165,050 ක මූල්‍යමය අවාසියක් සිදු වී තිබුණි. | ප්‍රසම්පාදනයන් සිදු කිරීමේදී මූල්‍යමය අවාසියක් ඇති නොවන ආකාරයට කටයුතු කල යුතු වීම. | ඉදිරියේදී මෙම තත්ත්වයන් අවම කර ගැනීමට කටයුතු කරන බව. |
| (ඇ) | ත්‍රිකුණාමලය දිසා වන කාර්යාලයේ ප්‍රසම්පාදන අනුමැතිය අනුව සැපයුම්කරු වෙතින් විශේෂිත මායිම් කණු 23,000 ක් රු. 1,299,750 කට දිස්ත්‍රික්ක 06 ක් වෙත ප්‍රවාහනය කිරීම සඳහා ගිවිසුමකට එළඹ තිබුණද මායිම් කණු 17,390 ක් පමණක් ප්‍රවාහනය කර තිබුණු අතර ඒ සඳහා රු. 1,525,025 ක් වැය කර තිබුණි. ඒ අනුව අනුමත වියදමට වඩා රු. 225,275 ක් වැය කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව අනුමත සීමාවන් තුල කටයුතු කල යුතු වීම. | එම මුදලට ප්‍රවාහනය කිරීමට අපහසු බව කොන්ත්‍රාත්කරු දන්වා සිටි බැවින් දුර ඒකක ලෙස පදනම්ව ගෙවීම් කරන ලද බව. |

**3.4** **පාඩු හා හානි**

-------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අලාභය රු. 25,000 ට අඩු සිද්ධීන් 27 කට අදාලව රු. 205,699 ක් ද, අලාභය රු. 25,000 ට වැඩි සිද්ධීන් 58 කට අදාලව රු. 17,309,769 ක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණු අතර, ඉන් රු. 5,308,195 වු අලාභ ඇති සිද්ධීන් 42 ක් සිදුවී වර්ෂ 10 ටත් වැඩි කාලයක් ගතවී තිබුණි. | වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අලාභය අයකර ගැනීම හා අවශ්‍ය විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම හෝ කපා හැරීමට ක්‍රියා කළ යුතු වීම. | කල් ගතවු සිද්ධීන් බැවින් තොරතුරු ලබා ගැනීමට අසිරු වී ඇති බවද පාඩු හා හානි තවදුරටත් අවම කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව . |
| (ආ) | සමාලෝචිත වර්ෂය සහ ඊට පෙර වර්ෂ වලදී සිදු වී තිබුණු රු. 401,502 ක් වු හානිවීම් 05 ක් මුලා ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අලාභ හානි මුල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කළ යුතු වීම. | මෙම හානි 2019 මුලා ප්‍රකාශන වල ඇතුලත් කිරීමට කටයුතු කරන බව. |

**3.5** **විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

---------------------------------------------

| විගණන විමසුම පිළිබඳ විස්තරය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලද විගණන විමසුම් 04 කට 2019 මාර්තු 31 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | විගණන විමසුම් වලට පිළිතුරු ලබා දිය යුතු වීම. | 2019 ජුලි 30 වන විට පිළිතුරු එවා ඇති බව. |

**3.6** **කළමනාකරණ දූර්වලතා**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ නීති නිලධාරිවරයාගේ සේවය නොලැබූ මාස 05 ක කාලයක් සඳහා රු. 395,620 ක දළ වැටුපක් ගෙවා තිබුණද එම කාලය තුල ඔහු සේවය හැරගිය සේ සලකා තිබුණි. | රාජ්‍ය සේවා කොමිෂන් සභා පටිපාටික රීති හි විධිවිධාන හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය පරිදි හිඟ වැටුප් සහිතව නැවත සේවයේ පිහිටුවීමට නියෝග කර ඇති බැවින් ඒ අනුව හිඟ වැටුප් ගෙවූ බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පෞද්ගලික සමාගමක් විසින් මොනරාගල දිස්ත්‍රික්කයේ 2012 වර්ෂයේ ජුනි මස අනවසර අඹ වගා ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණි. එම සමාගම මාස 05 ක් තුළ මෙම භූමිය හෙක්ටයාර් 06 සිට හෙක්ටයාර් 200 දක්වා ව්‍යාප්ත කර තිබුණි. | වන සංරක්ෂණ ආඥා පනතේ 20 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | දිසා වන නිළධාරී ඇතුළු මේ සඳහා වගකිව යුතු නිළධාරීන් 06 දෙනෙකුට චෝදනා පත්‍ර නිකුත් කර ඇති බව. |
| (ඇ) | ඉහත ව්‍යාපෘතිය ආරම්භ කර වසර 06 ක් ගත වී තිබුණද මෙම ව්‍යාපෘතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිසර නිර්දේශය ලබා ගෙන නොතිබුණි. | මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ ලබා ගත යුතු වීම. | පරිසර නිර්දේශ ලබා ගෙන නොමැති බව. |
| (ඈ) | අඹ ව්‍යාපෘතිය සඳහා මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා තිබූ නඩුව සඳහා 2016 අප්‍රේල් 22 දින අධිකරණය විසින් නෙරපීම් නියෝග ලබා දී තිබියදීත් වන සංරක්ෂක ජනරාල් විසින් ඉඩමට තෙකලා විදුලිය ලබා ගැනීමට විරුද්ධත්වයක් නොමැති බවට ලිපි නිකුත් කර තිබුණි. | නීතිමය ක්‍රියාමාර්ග වලට බලපෑමක් සිදු නොවන ලෙස කටයුතු කල යුතු වීම. | නීතී කටයුතු සඳහා අගතියක් නොවන අයුරින් විදුලි බලය ලබා දීම අනුමැතිය දුන් බව. |
| (ඉ) | වාහන අනතුරු 02 ක් සම්බන්ධයෙන් සිදුවී තිබුණු අලාභය රු.582,130 අදාල පාර්ශවයන්ගෙන් අය කර ගැනිමට කටයුතු කර නොතිබුණි. | අලාභය අදාල පාර්ශවයන්ගෙන් අය කිරිමට කටයුතු කල යුතු වීම. | වන්දි ලබා ගැනීම සඳහා නිතිපති දෙපාර්තමේන්තුව හරහා කටයුතු කරමින් පවතින බව. |
| (ඊ) | කන්තලේ අඩවි වන කාර්යාලයට යන පිවිසුම් මාර්ගයෙහි කාණු පද්ධතිය (මීටර් 90) හා පැති බැම්ම (මීටර් 70) සකස් කිරීම සඳහා රු. 1,145,022 ක් දරා තිබුණද කාණු පද්ධතිය පිවිසුම් මාර්ගයට ඉහලින් පිහිටා ඇති නිසා වැසි ජලය ගලා යාමක් සිදු නොවන බව නිරීක්ෂණය විය. | කාණු පද්ධතියට ජලය ගලා යාමට හැකි වන පරිදි සකස් කල යුතු වීම. | කාණු පද්ධතිය මාර්ගයට ඉහලින් පිහිටියද මාර්ගය පස් පුරවා සකස් කිරීමෙන් මෙම තත්ත්වය මගහරවා ගත හැකි බව. |
| (උ) | සමාලෝචිත වර්ෂයේදී අනුරාධපුර අඩවියෙහි කළුගල් බලපත්‍රලාභීන් 06 දෙනෙකුගෙන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශ වාර්තාවලට අනුව වැඩිපුර කඩා ඉවත් කර ඇති කළුගල් කියුබ් 1,057 ක් වෙනුවෙන් තවදුරටත් අය කර නොගත් රු. 618,630 ක් විය. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ වාර්තාව පදනම් කරගෙන හිඟ ගාස්තු අය කර ගත යුතු වීම. | මෙම බලපත්‍රලාභීන් හට නියමිත හිඟ ගාස්තු ගෙවන ලෙස දන්වා ඇති බවත් නොගෙවන්නේ නම් නීතීමය ක්‍රියාමාර්ග ගන්නා බව. |
| (ඌ) | 2016, 2017 සහ 2018 වර්ෂවලදී බලපත්‍රකරුවන් 113 දෙනෙකුගෙන් | අංක 1789/09 හා 2012 දෙසැම්බර් 17 දිනැති අති | මේ වන විට රු. 187,000 ක හිඟ ගාස්තු අය කරගෙන |

| | | | |
|---|---|---|---|
| | වැලි බලපත්‍ර ගාස්තු අය කිරීමේදී රු. 1,251,000 ක හිග මුද්දර ගාස්තු අය කරගෙන නොතිබුණි. | විශේෂ ගැසට් පත්‍රයෙහි උපදෙස් අනුව හිග මුද්දර ගාස්තු අය කල යුතු වීම. | ඇති බවත් ඉතිරිය බලපත්‍රකරුවන්ගේ ඇප තැන්පතු වලින් අය කිරීමට කටයුතු කරන බව. |
| (එ) | අනුරාධපුර දිසා වන නිලධාරිගේ අනු/දි.ව.නි/විමර්ශණ/2018 හා 2018 ඔක්තෝබර් 29 දිනැති ලිපියට අනුව විවිධ පාර්ශවයන්ගේ සහාය ලබා ගනිමින් පුද්ගලයකු රජයේ ඉඩම් කූට ලේඛන උපයෝගි කරගෙන මහා පරිමාණ ඉඩම් වංචාවන් සිදු කර තිබූ අතර දළ වශයෙන් එහි මූල්‍ය වටිනාකම රු. මිලියන 2,000 ක් පමණ වී තිබුණි. | රජයේ ඉඩම් කළමනාකරණය පිළිබඳව විශේෂ අවධානය යොමු කල යුතු වීම. | ඉදිරියේදී නීති උපදෙස් ලබා ගෙන ඒ අනුව කටයුතු සිදු කරන බව. |
| (ඒ) | පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය මගින් 2018 මාර්තු 10 දින කහටගස්දිගිලිය අඩවියේ අංක 194 කුරුණෑගල කොලණිය ප්‍රජා මූල සංවිධානය සඳහා ලබා දී ඇති ජල පෙරණ යන්ත්‍රය (Ro Plant) සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පරිහරණයට ගතහැකි තත්වයට පත්කර නොතිබුණි. | කඩිනමින් සවිකිරීමට කටයුතු කල යුතු වීම. | ජල පෙරන යන්ත්‍රය කඩිනමින් සවි කිරීමට කටයුතු කරන බව. |
| (ඔ) | කඹුරුපිටිය හා දෙනියාය අඩවි වන කාර්යාල වල 2019 වර්ෂයේදී ලියාපදිංචිය අළුත් නොකල දැව ව්‍යාපාර වලින් පිළිවෙලින් රු. 416,700 ක් ද, රු. 86,000 ක හිඟ ගාස්තු අය කරගෙන නොතිබුණි. | දැව ව්‍යාපාර ලියාපදිංචිය අළුත් කිරීමේ කටයුතු කඩිනම් කල යුතු වීම. | ලියාපදිංචි නොකරන දැව ව්‍යාපාර අවලංගු කිරීමටත් අනෙකුත් දැව ව්‍යාපාර නිසි කලට ලියාපදිංචි කිරීමටත් කටයුතු කරන බව. |
| (ඕ) | 1995 ජාතික වන ක්ෂේත්‍ර ප්‍රතිපත්තිය යටතේ දැව නොවන වනජ නිෂ්පාදන මුල් කොටගත් කර්මාන්ත ඇතුළු වනජ කර්මාන්ත ආරම්භ කිරීම හා නවීකරණය, නගා සිටුවීම පිණිස මූල්‍ය ආයතන හා අමාත්‍යාංශ අතර සහයෝගීතාවය ඇති කිරීම මඟින් මූල්‍ය පහසුකම් වර්ධනය සඳහා පියවර ගෙන නොතිබුණි. | 1995 ජාතික වන ක්ෂේත්‍ර ප්‍රතිපත්තිය හා මහා සැලැස්ම සංශෝධනය සිදු කල යුතු වීම. | මේ සම්බන්ධයෙන් පියවර ගෙන නොමැති බවත් ඉදිරියේදී කාර්ය මණ්ඩල සංශෝධනයේදී මේ සඳහා වෙනම අංශයක් ඇති කර කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව. |

**4.** **තිරසාර සංවර්ධන අරමුණු ලගා කර ගැනීම**

---

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක් වේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව තිරසාර සංවර්ධන අරමුණු 15 ට අදාලව අරමුණු හදුනාගෙන ඉලක්ක හා එය මැනීම සඳහා පාදක දත්ත හදුනා ගෙන තිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව ගොඩබිම පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම, ප්‍රතිස්ථාපනය, තිරසාර භාවිතය ප්‍රවර්ධනය කිරීම, වනාන්තර තිරසාර ලෙස කළමනාකරණය කිරීම , ජෛව විවිධත්ව හායනය වැලැක්වීම වන අරමුණු 2030 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ වන ආවරණය සියයට 32 දක්වා ඉහල නැංවීම ඉලක්කගත කරගෙන තිබුණි. එහෙත් දෙපාර්තමේන්තුවේ 2017 වර්ෂයේ කාර්යසාධන වාර්තාවට අනුව වන ආවරණය සියයට 35.1 ක ප්‍රතිශතයක් දක්වා වර්ධනය වී ඇති බව නිරීක්ෂණය විය. | මෙම ඉලක්ක ගත අරමුණු වර්තමානයට අනුව වෙනස් විය යුතු වීම. | ගූගල් චන්ද්‍රිකා ඡායාරූප යොදාගෙන **on screen digitizing** ක්‍රමයට වන ආවරණය සියයට 35.21 ක් ලෙස හදුනාගෙන තිබුණු බවද එම සිතියම ප්‍රකාශයට පත් නොකොට නැවත වන ආවරණය වෙනත් ක්‍රමවේදයකට අනුව මැනීම් සිදු කල බවත් ඒ අනුව වන ආවරණය සියයට 29.3 ක් බව අනාවරණය කර ගත් බව. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

---

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට පැවති පුරප්පාඩු 590 ක් පිරවීමට අපොහොසත් වී තිබුණි. | පිරවීමට කටයුතු කල යුතු වීම. | පුරප්පාඩු ඇති වීමට හේතුව සේවයෙන් ඉල්ලා අස්වීම, සේවය අතහැරයාම. සේවය අත්හිටුවීම්, විශ්‍රාම යාම, මිය යාම ආදිය බව. |